# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2012/20 - 2017 මාර්තු මස 29 වැනි බදාදා - 2017.03.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 9/2013

**(460 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනත**

(460 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 63 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තියේ (ඊ) ඡේදය යටතේ ඉඩම් අමාත්‍යවරයා පනවනු ලැබ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් 2017 පෙබරවාරි මස 23 දින අනුමත කරන ලද නියෝග.

ආචාර්ය අයි. එච්. කේ. මහානාම,
ලේකම්,
ඉඩම් අමාත්‍යාංශය.

2017 මාර්තු මස 20 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2014 මැයි මස 30 වැනි දින අංක 1864/54 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ 2016 ජූලි මස 26 වැනි දින අංක 1977/8 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග මගින් සංශෝධිත පරිදි වන, 2013 ඉඩම් අත්පත් කර ගැනීමේ (වන්දි ගෙවීම්) නියෝගවල 4(2) වන නියෝග පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමෙන්, ඒ නියෝග මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

(1) එහි (ග) ඡේදයේ (iii) වන අනු-ඡේදයේ දෙවන අතුරු විධානය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අතුරු විධානය ආදේශ කිරීමෙන් :-

> "එසේම තවදුරටත්, 2(2) වන නියෝගයේ (අ), (ආ), (ඇ), (ඈ), (ඉ), (ඊ), (උ), (ඌ), (එ), (ඒ), (ඔ), (ඕ), (ක), (ග), (ච), (ජ), (ට) සහ (ඩ) ඡේදවල සඳහන් නිශ්චිත ව්‍යාපෘති යටතේ නැවත පදිංචි වන තැනැත්තකුට, මෙම ඡේදය යටතේ හිමිවන ඉඩම් කැබැල්ලකට අතිරේක වශයෙන්, ලාර්ක් කමිටුව විසින් සුදුසු යැයි අදහස් කරන්නේ නම්, (ජ) ඡේදයේ විධිවිධාන සලස්වා ඇති පරිදි ස්වයං ප්‍රතිස්ථාපනය සඳහා අදාළ වන මුදල් ගෙවීම ද ලබා දිය හැකි ය."



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2 එහි (ජ) ඡේදයේ (iii) වන අනු-ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනු-ඡේදය ආදේශ කිරීමෙන් :-

"(iii) අ. 2(2) වන නියෝගයේ (අ), (ආ), (ඇ), (ඈ), (ඉ), (ඊ), (උ), (ඌ), (එ), (ඒ), (ඔ), (ඕ), (ක), (ග), (ච), (ජ), (ට) සහ (ඩ) ඡේදවල සඳහන් නිශ්චිත ව්‍යාපෘති යටතේ සිදු කරන යම් ස්වයං ප්‍රතිස්ථාපනයක් සඳහා ගෙවීම පහත දැක්වෙන පරිදි විය යුතු ය.:-

| | |
|---|---|
| මහ නගර සභා බල ප්‍රදේශ | රු. 500,000 |
| අගනගර හා ආයෝජන මණ්ඩල කලාපවල පිහිටි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සහ නගර සභා බල ප්‍රදේශ | රු. 300,000 |
| ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ | රු. 150,000 |

ආ. 2(2) වන නියෝගයේ (ණ) සහ (ත) ඡේදවල සඳහන් නිශ්චිත ව්‍යාපෘති යටතේ සිදු කරන යම් ස්වයං ප්‍රතිස්ථාපනයක් සඳහා ගෙවීම පහත දැක්වෙන පරිදි විය යුතු ය. :-

| | |
|---|---|
| මහ නගර සභා බල ප්‍රදේශ | රු. 1000,000 |
| අගනගර හා ආයෝජන මණ්ඩල කලාපවල පිහිටි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සහ නගර සභා බල ප්‍රදේශ | රු. 750,000 |
| ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ | රු. 500,000" |

04 - 299

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.